ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021/2022
1 වන මට්ටම - I වන වර්ෂාර්ධය
අවසාන පරීක්ෂණය
**DSC1712** - මානව භූගෝලවිද්‍යාව

දිනය: 2022 ජුනි 05 | **වේලාව:** පෙ.ව. 9.30 - ප.ව. 12.30

උපදෙස්:

1. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. ( **I** කොටස හා **II** කොටස).
2. **I** කොටසට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර **II** කොටසින් ප්‍රශ්න හතරක් තෝරා ගත හැකි අතර පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න 05කි.

## I කොටස

1. පහත දැක්වෙන ස්ථාන ලබා දී ඇති ලෝක සිතියමේ ලකුණු කර නම් කරන්න.

   I. ඇෆ්ගනිස්ථානය සහ යුක්‍රේනය (ලකුණු 02)
   II. චීනයේ සහ අප්‍රිකානු මහද්වීපයේ දිගම ගංගා (ලකුණු 02)
   III. ලෝකයේ ගල් අඟුරු නිපදවන කරන ප්‍රධාන රටවල් දෙකක් (ලකුණු 02)
   IV. තුනී ජනගණත්වයක් සහිත ඇරිසෝනා සහ සහරා කාන්තාර ප්‍රදේශ (ලකුණු 02)
   V. ලෝකයේ විශාලතම වරායයන් වන ෂැංහයි සහ සිංගප්පූරු වරායන් (ලකුණු 02)
   VI. ලොව සුන්දරතම දූපත් දෙකක් වන මාලදිවයින සහ මුරුසි දිවයින (ලකුණු 02)
   VII. මකර නිවර්ථය (ලකුණු 02)
   VIII. මධ්‍යධරණී කෘෂිකර්මාන්තය ව්‍යාප්ත ප්‍රදේශ දෙකක් වන මධ්‍යම චිලී සහ කැලිෆෝනියා වෙරළබඩ ප්‍රදේශය (ලකුණු 02)
   IX. අධික ජනගහනයක් සහිත මෙක්සිකෝවේ මෙක්සිකෝ සිටි සහ ජපානයේ ටෝකියෝ (ලකුණු 02)
   X. ප්‍රාන්ත රාජ්‍යයන් දෙකක් (සිදුරු රාජ්‍යයන්) වන ලෙසෝතෝ සහ වතිකානු රාජ්‍යය (ලකුණු 02)

## II කොටස

2. I. භෞතික භූගෝල විද්‍යාව සහ මානව භූගෝල විද්‍යාව යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 05)

   II. මානව භූගෝල විද්‍යාවට අනෙකුත් ශික්ෂණයන් අන්තර්ගත වන ආකාරය නියමිත රූපසටහන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 15)

3. I. ෆෙඩ්‍රික් රැට්සල් (Friedrich Ratzel) විසින් මූලික අඩිතාලම දැමූ පාරිසරික නියතිවාදය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 10)

   II. ස්වාභාවික උපද්‍රව ජය ගැනීමට ශිෂ්ටාචාරගත මානවයා අනුගමනය කළ උපායමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

4. I. ස්වාභාවික සම්පත් වර්ගීකරණය නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 10)

   II. ශ්‍රී ලංකාවේ පවතින ස්වාභාවික සම්පත්වල වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10)

5. I. මානව සංක්‍රමණ යනු කුමක්ද? (ලකුණු 05)

   II. ලෝකයේ මානව සංක්‍රමණයන්හි ප්‍රධාන ප්‍රවාහයන් විස්තර කරන්න. (ලකුණු 15)

6. I. වර්ෂ 1990 දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP) විසින් හඳුන්වා දුන් මානව සංවර්ධන දර්ශකයේ (HDI) වැදගත්කම පිළිබඳ කෙටියෙන් දක්වන්න. (ලකුණු 10)

   II. ලෝකයේ සංවර්ධිත හා ඌණ සංවර්ධිත රටවල ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10)

7. I. ප්‍රාථමික ආර්ථික කටයුතු මොනවාදැයි නිර්වචනය කරන්න. (ලකුණු 05)

   II. ද්විතීක සහ තෘතීක ආර්ථික කටයුතු අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 15)

8. I. දරිද්‍රතාවය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර ලෝකයේ දරිද්‍රතා ව්‍යාප්තිය විස්තර කරන්න. (ලකුණු 10)

   II. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටු දැකීම සඳහා ගෙන ඇති උත්සහයන් විස්තර කරන්න. (ලකුණු 10)

9. I. රටක සෑම වසර 10කට වරක් සංගණනය කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ව්‍යාප්තියේ මෑතකාලීන ප්‍රවණතා සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

10. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට **(02)** කෙටි සටහන් සපයන්න.

a) ඇමරිකා එක්සත් ජනපදයේ සිලිකන් නිම්නයෙහි ඇති වැදගත්කම

b) ශ්‍රී ලංකායේ නාගරීකරණයේ මෑතකාලීන ප්‍රවණතා

c) ජනවාර්ගික භූගෝලවිද්‍යාව

d) ආගම්හි භූගෝලීය විසරණය

e) සංවර්ධනයේ පාරිසරික බලපෑම්

(ලකුණු 10 x 2)

*** සියලු හිමිකම් ඇවිරිණි ***

# World Map

Registration..............................

